# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,145 — 1962 ජූනි 1 වැනි සිකුරාද — 1962.6.1

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 834 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 831 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 831 | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 832 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 833 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... — | 842 |
| | | "සුරාබද්දු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... — | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 213

අංකය: ඩී. 153/ඒ/රෙක් ට්.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරි තැන 1962 මැයි මස 26 වැනි දින සිට, යුද්ධ හමුදාවේ නිත්‍ය හට සේනාවෙන් විශ්‍රාම ලබනවා ඇත:—

මේජර් සොලමන් ඩග්ලස් ඩයස් සමරසිංහ, ල. සි. රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ක්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි 11 වෙනිදා,
කොළඹ දීය.

6-12

---

1962 අංක 214

අංකය: ඩී. 17/රෙක් ට්.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීමක්

1962 මැයි මස 1 වැනි දින සිට, 1949 අංක 17 දරණ හමුදා ආඥා පනතේ 13 (1) වගන්තිය යටතේ ආධුනිකයන් බඳවන නිලධාරියකු වශයෙන්—

තාවකාලික මේජර් සිසිල් තියඩෝර් කල්දේරා, ල. පා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ක්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි 12 වෙනිදා,
කොළඹ දීය.

6-13


8 —බී 42794—4,939 (5/62)


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1962 අංක 215

අංකය: ඒ. 139/62.

1962 අප්‍රියෙල් මස 30 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සංස්කෘතික කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂක සිවිල් සේවක වී. පණ්ඩිත මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව ශ්‍රී ලංකා ජාතික කලායතනයේ අධ්‍යක්ෂක වශයෙන් වැඩ බැලීමට.

අංකය: ඒ. 150/62.

1962 මැයි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩබ්ලිව්. ආර්. බී. රාජකරුණා මහතා කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංකය: ඒ. 81/62.

1962 අප්‍රියෙල් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක සී. විස්වාසම් මහතා නියෝජ්‍ය ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

අංකය: ඒ. 82/62.

1962 අප්‍රියෙල් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත සිවිල් සේවක ඇන්. විජේවර්ධන මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

අංකය: ඒ. 151/62.

1962 මැයි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඇස්. එච්. ඇම්. ඉසෙඩ් ෆාරුක් මහතා මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය: ඒ. 149/62.

1962 මැයි මස 4 වැනි දින සිට වෛද්‍ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී හෝ නැවත නියමයක් කරන තුරු හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ

නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා) වෛද්‍ය වී. ටී. එච්. ගුණරත්න මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ලෙස වැඩ බැලීමට.

අංකය : ඒ. 136/62.

1962 මැයි මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අලෙවිකිරීමේ සංවර්ධන කොමසාරිස් බී. ඇල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා ගණන් පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අතිරේක නියෝජ්‍ය ඔඩිටර් ජනරාල් (තාවකාලික) ලෙස වැඩ බැලීමට.

අංකය : ඒ. 103/62.

1962 මැයි මස 9 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ජී. ඒ. ඇල්. ඇම්. වික්‍රමසිංහ මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ 4 වැනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි මස 28 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

6-240

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 216

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑල්. 37ඒ/55.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ජේ. රාජරත්නම් මහතා 1962 මැයි 9 වැනි දින සිට 1962 ජූනි 9 වැනි දින දක්වා, කෑගල්ලේ දිස්ත්‍රික් නඩුකාර ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑම්. 2/56 (III).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 මැයි 21 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දෙහිවල-ගල්කිස්ස, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු බී. එස්. නෙත්සිංහ මහතා 1962 මැයි 9 වැනි දින සිට 1962 ජූනි 9 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා රික්වැස්ට් කොමසාරිස් ධුරයේ, හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඒ. 43/48.

එම්. ජමීල් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 9 වැනි දින සිට, මාතර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 71666 දරණ ප්‍රාථමික නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා 1962 මැයි 21 වැනි දින සිට 1962 ජූනි 18 වැනි දින දක්වා හෝ නැවත නියමයක් කරන තුරු, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 මැයි 17 වැනි දින, බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/56.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ඒ. ඊ. මීගුම මහතා 1962 මැයි 17 වැනි දින සිට 22 වැනි දින දක්වා, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. පී. සේනාරත්න මහතා 1962 මැයි 16 වැනි දින, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 මැයි 25 වැනි දින සිට 28 වැනි දින දක්වා හා 1962 ජූලි 15 වැනි හා 16 වැනි දිනයන්හි, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 58ඒ/59.

බී. සේනාරත්න මහතා 1962 මැයි 17 වැනි දින නැවත වැඩ බාර ගන්නා තුරු, හා 1962 මැයි 26 වැනි දිනද හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසීර්වාදම් මහතා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1962 මැයි 29 වැනි දින සිට 1962 ජූනි 1 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 9ඒ/52.

ඊ. ඕ. එෆ්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 මැයි 30 වැනි දින, කළුතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/57.

ඒ. එම්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1962 මැයි 18 වැනි දින සිට 21 වැනි දින දක්වා, (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසීර්වාදම් මහතා 1962 මැයි 25 වැනි හා 26 වැනි දිනයන්හි, රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 65ඒ/61.

ජේ. බී. සී. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. එස්. වී. පෙරේරා මහතා 1962 මැයි 21 වැනි දින සිට 24 වැනි දින දක්වා, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේ. බී. ධර්මකීර්ති මහතා 1962 මැයි 26 වැනි හා 27 වැනි දිනයන්හි, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමාම්පිල්ලේ මහතා 1962 මැයි 19 වැනි දින සිට 21 වැනි දින දක්වා, මන්නාරමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඒඒ. 44/57.

එස්. ඒ. යටවර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මැයි 22 වැනි දින සිට ආඩියගල ගම්බද උසාවියේ අංක 261 සහ 262 දරණ සිවිල් නඩුවල තීන්දු දීමට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තමන් කඩුව පලාතේ හා කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා දකුණු නුරුළු පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඒඒ. මිශ්‍ර/57.

සී. බී. ද සිල්වා මහතා 1962 ජූනි 1 වැනි, 2 වැනි, 4 වැනි දින සිට 9 වැනි දින දක්වා, 11 වැනි, 13 වැනි දින සිට 15 වැනි දින දක්වා, 18 වැනි දින සහ 20 වැනි දින සිට 22 වැනි දින දක්වා, 25 වැනි දින හා 27 වැනි දින සිට 29 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු සහ දකුණු නුරුළු පලාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පරනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආර්. සත්චිත්තානන්දම් මහතා 1962 මැයි 21 වැනි හා 22 වැනි දිනයන්හි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කඩ්ඩුකුලම් සහ තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. කරුණාරත්න මහතා 1962 මැයි 16 වැනි හා 17 වැනි දිනයන්හි, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර, සී. රාසයියා මහතා 1962 මැයි 21 වැනි දින, යාපනේ සහ පේදුරු තුඩුව දිස්ත්‍රික්කවල, උතුරු සහ නැගෙනහිර වලිකාමම්, වඩමරාච්චි සහ යාපනේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 මැයි 24 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

6-175

## වෙනත් පත්කිරීම් ආදිය

**1962 අංක 217**

(20 වෙනි පරිච්ඡෙදය) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංකය : අයි.එන්.ක්‍යු/එල්. 21/4/62.

1962 අප්‍රේල් මස 25 වැනි දින සිට කේ. සෝමසුන්දරම් මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාර දිස්ත්‍රික්කයේ, කරාවුකු සහ නයිනාතවූර් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. නල්ලෙයිනාදන් මහතාද,

අංකය : අයිඑන්.ක්‍යු/එල්. 4/3/61.

1962 මැයි මස 5 වැනි දින සිට වී. විමලසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ සහ නැගෙනහිර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට සී. කේ. පණ්ඩිතරත්න මහතාද,

අංකය : අයිඑන්. ක්‍යු/එල්. 14/8/57.

1962 මැයි මස 7 වැනි දින සිට ඩී. ඇස්. එදිරිසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගන් දහය කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. බී. මේසසූරිය මහතාද,

අංකය : අයි.එන්.ක්‍යු/එල්. 6/1/58.

1962 මැයි මස 10 වැනි දින සිට එන්. පී. ද ඉසෑඩ්. ජයතිලක මහතා නැවත වැඩ භාරගන්නාතුරු ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිතර, ඌරගහ, කොස්ගොඩ, හා අම්බලන්ගොඩ-බලපිටිය, කරන්දෙනිය සහ විදන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඩී. ඒ. අස්සලආරච්චි මහතාද,

අංකය : අයි. එන්. ක්‍යු/එල්. 21/5/62.

1962 මැයි මස 17 වැනි දින සිට පී. එල්. පැට්‍රික් මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ, අක්කරේපි පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයට බී. ඒ. ජේ. කාසිනාඩාර් මහතාද,

පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 මැයි මස 23 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

6-251

**1962 අංක 218**

මගේ අංකය : ඒ.ජේ. 34/7/56.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) දිවුරුම් කොමසාරිස්වරයකු වන වයි. එම්. ඩී. බී. පියතිලක මහතා බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

(2) කේ. ඩී. එච්. ඩේවිඩ් සිල්වා මහතා ත්‍රිකුණාමලේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

පත්කර ඇත්තේය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 මැයි මස 28 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

6-252

**1962 අංක 219**

**දැන්වීමයි**

කන්කානිඅච්චි හග්ගල්ලගේ මිල්වත් විජය සුමනරත්න මහතා කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂා වන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 මැයි මස 23 වැනි දින,
කොළඹ දීය.

6-85

**1962 අංක 220**

**කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් කරනු ලබන අතිරේක ව්‍යවස්ථාගත පත්කිරීම්**

අංකය: ඊබී/ඒ—204.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ:—

බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත, එන්. විජේවර්ධන මහතා, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බලන කාලය තුළ සවකීය රාජකාරි වලට අතිරේකව, 1962 අප්‍රේල් 16 වැනි දින සිට, නැවත නියෝගයක් කරන තුරු, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්.

ඇම්. ජේ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 මැයි මස 23 වැනි දින,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

6-128

# ආණ්ඩුවේ නිවේදන

අංකය : පී.ආර්/ඒඑෆ්/9.

වයි. එච්. එක්මාර්ක් මහතා කොළඹ සිටින ස්වීඩනයේ නිර්වේතනික කොන්සල් ජනරාල් වශයෙන් වැඩ කටයුතු නොකරන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කර සිටී.

ඇන්. කෘ. දියෙස්,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 මැයි මස 16 වැනි දින,
කොළඹ 1, සෙනෙට් මන්දිරයෙහි,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ දීය.

6-14/1

---

අංකය : පී.ආර්/ඒඑෆ්/9.

සෙත් ඔටෝ බර්ටිල් හොල්ස්ට්‍රෝම් මහතා කොළඹ සිටින ස්වීඩනයේ නිර්වේතනික කොන්සල් ජනරාල් වශයෙන් විදේශ කටයුතු භාර ගරු ඇමතිනී විසින් විධිවත් ලෙස පිළිගැනීමට සතුටුවී ඇත.

ඇන්. කෘ. දියෙස්,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 මැයි මස 16 වැනි දින,
කොළඹ 1, සෙනෙට් මන්දිරයෙහි,
විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ දීය.

6-14/2

---

ඇල්. ඞී.—බී. 29/61.

අංකය : 965/15/124 (ඇස්බී/ඊ).

## 1961 අංක 65 දරන මුදල් පනත

1961 අංක 65 දරන මුදල් පනතෙහි 56 වෙනි හා 60 වෙනි වගන්ති යටතෙහි මුදල් ඇමති විසින් සම්පාදනය කරනු ලැබූ නියෝග.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962.5.17,
කොළඹ.

### නියෝග

#### වෘත්තීන් හා ව්‍යාපාර ලියාපදිංචි කිරීම

1. (1) යම් වෘත්තියක යෙදී සිටින තැනැත්තකු විසින් පනතෙහි VII වෙනි කොටසෙහි කාර්යයන් සඳහා ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන හැම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි උප ලේඛනයෙහි සඳහන් ආර් පී බී 1 දරන ආකෘති පත්‍රයෙහි සාරානුකූලව විය යුතුය. ආකෘති පත්‍රයෙහි සඳහන් කිරීමට නියමිත සියලු ම විස්තර ඉල්ලුම්කරු විසින් එහි සඳහන් කළ යුතු ය. ආකෘති පත්‍රය නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් පසු ඉල්ලුම්කරු විසින්—

(අ) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය තුළ ඔහු පදිංචිව සිටින්නේ නම්, එය කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්යාලයට හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන වෙනයම් කාර්යාලයකට ද,

(ආ) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයෙන් පිට ඔහු පදිංචිව සිටින්නේ නම්, ඉල්ලුම්කරු පදිංචිව සිටින පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිට හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන අවස්ථාවක කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්යාලයට හෝ එය යැවිය යුතු ය.

(2) (1) වෙනි ඡේදය යටතෙහි ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසු එය ලැබූ කාර්යාලය භාර නිලධාරියා විසින්—

(අ) ඉල්ලුම් පත්‍රයෙහි අංක යොදවා, ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය ද ඔහු යෙදෙන වෘත්තිය ද සමග ඉල්ලුම් පත්‍රයට දෙනු ලැබූ අංකය ද (මෙහි මින්මතු වෘත්තීන් හා ව්‍යාපාර පිළිබඳ ප්‍රාථමික ලේඛනය යනුවෙන් හඳුන්වනු ලබන) ලේඛනයෙහි ඇතුළත් කර විය යුතු ය.

(ආ) ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුවක් ගෙවීමට ඉල්ලුම්කරු යටත් නම්, ඒ ගාස්තුවෙහි ගණන ද ඒ ගාස්තුව ගෙවිය යුතු කාර්යාලය ද සඳහන් කරනු ලැබූ ගෙවිලි තුන්ඩුවක් ඔහුට යැවීමට සැලැස්විය යුතු ය.

(ඇ) ජාතික සංවර්ධන බද්ද ගෙවීමට ඉල්ලුම්කරු යටත් ව ඔහු ඒ බදු වාරික වශයෙන් ගෙවීමට තෝරා ගත්තෙහි නම්, (ගණනින් හතරකට අධික නොවන) වාරිකවල ගණන ද, එක් එක් වාරිකයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද, ඒ දිනය ද නිශ්චය කළ යුතු ය. තවද ඒ බද්ද වාරික වශයෙන් ගෙවීමට ප්‍රතිඥාවක් සැපයීමට ඔහුට අවස්ථාවක් ලබා දීම සඳහා මෙහි උපලේඛනයෙහි සඳහන් ආර්පීබී 2 දරන ආකෘති පත්‍රයක් සැපයිය යුතු ය.

(3) ගෙවිලි තුන්ඩුව ලැබුණු කල්හි ඉල්ලුම්කරුවකු විසින් ඒ ගෙවිලි තුන්ඩුවේ නියමිත කාර්යාලයට ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවිය යුතු අතර ඒ ගාස්තුව ගෙවීම පිළිගත් බව දන්වා ඒ කාර්යාලය විසින් නිකුත් කරනු ලැබූ කුවිතාන්සිය සමග ආර්පීබී 2 දරන යම් ආකෘති පත්‍රයක් වුවහොත් එය ද නිසියාකාර සම්පූර්ණ කොට අත්සන් තබා, ලියාපදිංචි කිරීම සඳහා සවකීය ඉල්ලුම් පත්‍රය යැවූ කාර්යාලය වෙත යැවිය යුතු ය. ඉක්බිති ව අන්තිමට සඳහන් කළ කාර්යාලය භාර නිලධාරියා විසින් ඒ ඉල්ලුම්කරු ලියාපදිංචි කරවා, මෙහි උප ලේඛනයෙහි දැක්වෙන ආර්පීබී 3 ඒ දරන ආකෘති පත්‍රය ප්‍රකාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය. නැතහොත් නිකුත් කර විය යුතු ය. ඒ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුවක් ගෙවීමට බැඳී නැති තැනැත්තකු විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ අවස්ථාවක, ඒ ඉල්ලුම් පත්‍රය යැවූ කාර්යාලය භාර නිලධරයා විසින් මෙහි උපලේඛනයේ දැක්වෙන ආර්පීබී 3 ඒඒ දරන ආකෘති පත්‍රය ප්‍රකාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය. නැතහොත් නිකුත් කර විය යුතු ය. ජාතික සංවර්ධන බද්ද ගෙවීමට බැඳී සිටින තැනැත්තකු ඒ බද්ද වාරික වශයෙන් නො ගෙවා හෝ ඒ බද්ද වාරික වශයෙන් ගෙවීමට පොරොන්දු නොවී සිටියහොත් ඒ තැනැත්තා වෙත මේ ඡේදය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් නො කළ යුතු ය.

(4) යම් තැනැත්තකු වෙත (3) වෙනි ඡේදය යටතෙහි ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ යම් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් වුවහොත්, එහි ගණන ඔහු වෙත නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අංකය හා ඔහු විසින් ගෙවිය යුතු යම් ජාතික සංවර්ධන බද්දක් වුවහොත් එහි ගණන ද එහි සහතික නිකුත් කරන නිලධරයා විසින් වෘත්තීන් හා ව්‍යාපාර පිළිබඳ ප්‍රාථමික ලේඛනයෙහි නිසි තැන්හි ඇතුළත් කළ යුතු ය; නැතහොත් ඇතුළත් කර විය යුතු ය.

(5) (3) වෙනි ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා වූ හැම ඉල්ලුම් පත්‍රයක් ම ඒ සහතිකය අවලංගු විය යුතු දිනයට යටත් පිරිසෙයින් තිස් දිනකට වත් පෙර ඉදිරිපත් කළ යුතු ය.

2. (1) යම් ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන යම් තැනැත්තකු විසින් පනතෙහි vii කොටසෙහි කාර්යයන් සඳහා ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන හැම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි උපලෙඛනයේ සඳහන් ආර්පීබී 1 දරන ආකෘති පත්‍රය ප්‍රකාර විය යුතු ය. ආකෘති පත්‍රයෙහි සඳහන් කිරීමට නියමිත සියලු ම විස්තර ඉල්ලුම්කරු විසින් එහි සඳහන් කළ යුතු ය. ආකෘති පත්‍රය නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් පසු ඉල්ලුම්කරු විසින්—

(අ) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය තුළ ඔහු ඒ ව්‍යාපාර කටයුතු කර ගෙන යන්නේ නම් එය කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්යාලයට හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන වෙනයම් කාර්යාලයකට ද,

(ආ) ඔහු කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයෙන් පිට ව්‍යාපාර කටයුතු කර ගෙන, යන්නේ නම්, ඉල්ලුම්කරු ව්‍යාපාර කටයුතු කර ගෙන යන පරිපාලන දිස්ත්‍රික්කයෙහි දිසාපතිට හෝ කොමසාරිස්වරයා නියම කරනු ලබන අවස්ථාවක, කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්යාලයට හෝ එය යැවිය යුතු ය.

(2) (1) වෙනි ඡේදය යටතේ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසු එය ලැබුණු කාර්යාලය භාර නිලධරයා විසින්—

(අ) ඉල්ලුම් පත්‍රයෙහි අංක යොදා ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය ද ඉල්ලුම්කරු විසින් කර ගෙන යනු ලබන ව්‍යාපාර කටයුතුවල සවභාවය ද ඒ ව්‍යාපාර කටයුතු කර ගෙන යන සථානය ද සමග ඉල්ලුම් පත්‍රය දෙනු ලැබූ අංකය ද වෘත්තීන් හා ව්‍යාපාර කටයුතු පිළිබඳ ප්‍රාථමික ලේඛනයෙහි ඇතුළත් කර විය යුතු ය.

(ආ) ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුවක් ගෙවීමට ඉල්ලුම්කරු යටත් නම්, ඒ ගාස්තුවේ ගණන ද ඒ ගාස්තුව ගෙවියයුතු කාර්යාලය ද සඳහන් කරනු ලැබූ ගෙවිලි තුන්ඩුවක් ඔහුට යැවීමට සැලැස්විය යුතු ය.

(ඇ) ජාතික සංවර්ධන බද්ද ගෙවීමට ඉල්ලුම්කරු යටත් ව, ඔහු ඒ බදු වාරික වශයෙන් ගෙවීමට තෝරා ගත්තෙහි නම්, (ගණනින් හතරකට අධික නොවන) වාරිකවල ගණන ද, එක් එක් වාරිකයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද, ඒ දිනය ද නිශ්චය කළ යුතු ය. තවද ඒ බද්ද වාරික වශයෙන් ගෙවීමට ප්‍රතිඥාවක් සැපයීමට ඔහුට අවස්ථාවක් ලබා දීම සඳහා මෙහි උපලේඛනයෙහි සඳහන් ආර්පීබී 2 දරන ආකෘති පත්‍රයක් සැපයිය යුතු ය.

(3) ගෙවිලි තුන්ඩුව ලැබුණු කල්හි ඉල්ලුම්කරුවකු විසින් ඒ ගෙවිලි තුන්ඩුවෙහි නියමිත කාර්යාලයට ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවිය යුතු අතර ඒ ගාස්තුව ගෙවීම පිළිගත් බව දත්වා ඒ කාර්යාලය විසින් නිකුත් කරනු ලැබූ කුවිතාන්සිය සමඟ ආර්පීබී 2 දරන යම් ආකෘති පත්‍රයක් වුවහොත් එය ද නිසියාකාර සම්පූර්ණ කොට අත්සන් තබා, ලියාපදිංචි කිරීම සඳහා සවකීය ඉල්ලුම් පත්‍රය යැවූ කාර්යාලය වෙත යැවිය යුතු ය. ඉක්බිති ව අන්තිමට සඳහන් කළ කාර්යාලය භාර නිලධරයා විසින් ඒ ඉල්ලුම්කරු ලියාපදිංචි කරවා, මෙහි උපලේඛනයෙහි දැක්වෙන ආර්පීබී 3බී දරන ආකෘති පත්‍රය ප්‍රකාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය. නැතහොත් නිකුත් කර විය යුතු ය. ඒ ලියාපදිංචි කිරීම සඳහා ගාස්තුවක් ගෙවීමට බැඳී නැති තැනැත්තකු විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ අවස්ථාවක ඒ ඉල්ලුම් පත්‍රය යවනු ලැබූ කාර්යාලය භාර නිලධරයා විසින්, මෙහි උපලේඛනයෙහි දැක්වෙන ආර්පීබී 3බීබී දරන ආකෘති පත්‍රය ප්‍රකාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය. නැතහොත් නිකුත් කර විය යුතු ය. ජාතික සංවර්ධන බද්ද ගෙවීමට බැඳී සිටින තැනැත්තකු ඒ බද්ද වාරික වශයෙන් නො ගෙවා හෝ ඒ බද්ද වාරික වශයෙන් ගෙවීමට පොරොන්දු නො වී සිටියහොත්, ඒ තැනැත්තා වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් නො කළ යුතු ය.

(4) යම් තැනැත්තකු වෙත (3) වෙනි ඡෙදය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ යම් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් වුවහොත් එහි ගණන, ඔහු වෙත නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අංකය හා ඔහු විසින් ගෙවිය යුතු යම් ජාතික සංවර්ධන බද්දක් වුවහොත් එහි ගණන ද ඒ සහතිකය නිකුත් කළ නිලධරයා විසින් වෘත්තීන් හා ව්‍යාපාර පිළිබඳ ප්‍රාථමික ලේඛනයෙහි නිසි තැන්හි ඇතුළත් කළ යුතු ය. නැතහොත් ඇතුළත් කර විය යුතු ය.

(5) (3) වෙනි ඡෙදය යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා වූ හැම ඉල්ලුම් පත්‍රයක් ම ඒ සහතිකය අවලංගු විය යුතු දිනයට යටත් පිරිසෙයින් තිස් දවසකටවත් පෙර ඉදිරිපත් කළ යුතු ය.

3. මේ නියෝග යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක්—

(අ) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් ගාස්තුවක් ගෙවනු නො ලැබුවහොත් කහ පාටින් විය යුතු ය;

(ආ) ඔහු විසින් ගෙවනු ලැබූ ගාස්තුව රුපියල් දෙසීයක් වුව හොත් නිල් පාටින් විය යුතුය;

(ඇ) ඔහු විසින් ගෙවනු ලැබූ ගාස්තුව රුපියල් දෙසිය පනහක් වුවහොත් තද රතු පාටින් විය යුතු ය;

(ඈ) ඔහු විසින් ගෙවනු ලැබූ ගාස්තුව රුපියල් තුන් සීයක් වුව හොත් ලා රතු පාටින් විය යුතු ය; තවද

(ඉ) ඔහු විසින් ගෙවනු ලැබූ ගාස්තුව රුපියල් තුන්සිය පනහක් වුවහොත් කොළ පාටින් විය යුතු ය.

මේ නියෝග යටතේ ලාංකික නො වූවකු වෙත නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් සුදු පාටින් විය යුතු ය.

4. (1) කොමසාරිස්වරයා විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන්—

(අ) වෘත්තීන් පිළිබඳ ද්විතීය ලේඛනය යනුවෙන් හැඳින්විය යුතු ලේඛනයක් ; හා

(ආ) ව්‍යාපාර පිළිබඳ ද්විතීය ලේඛනය යනුවෙන් හැඳින්විය යුතු ලේඛනයක් ;

පිළියෙළ කොට පවත්වා ගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) පනතෙහි VII වෙනි කොටසෙහි කාර්යයන් සඳහා තත්කාලයෙහි ලියාපදිංචි ව, ජාතික සංවර්ධන බද්ද ගෙවීමට බැඳී ඇති, වෘත්තියක යෙදී සිටින සැම තැනැත්තකුගේ ම නම හා ඔහු සම්බන්ධයෙන් වෘත්තීන් හා ව්‍යාපාර පිළිබඳ ප්‍රාථමික ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ වෙනත් විස්තර ද, වෘත්තීන් පිළිබඳ ද්විතීය ලේඛනයෙහි අන්තර්ගත විය යුතු ය. ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය, ප්‍රාදේශීය බල මණ්ඩලය හා ඔවුන් පදිංචි ගම්මුලාදෑනි කොට්ඨාශය අනුව ඒ තැනැත්තාගේ නම් අකාරාදී ක්‍රමයට පිළියෙළ කළ යුතු ය.

(3) පනතෙහි VII වෙනි කොටසෙහි කාර්යයන් සඳහා තත්කාලයෙහි ලියාපදිංචි ව, ජාතික සංවර්ධන බද්ද ගෙවීමට බැඳී ඇති, ව්‍යාපාරයක් පවත්වා ගෙන යන යම් තැනැත්තකුගේ නම හා ඔහු සම්බන්ධයෙන් වෘත්තීන් හා ව්‍යාපාර පිළිබඳ ප්‍රාථමික ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ වෙනත් විස්තරද ව්‍යාපාර පිළිබඳ ද්විතීය ලේඛනයෙහි අන්තර්ගත විය යුතු ය. ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය, ප්‍රාදේශීය බල මණ්ඩලය හා ඔවුන් පදිංචි ගම්මුලාදෑනි කොට්ඨාශය අනුව ඒ තැනැත්තාගේ නම් අකාරාදී ක්‍රමයට පිළියෙළ කළ යුතු ය.

5. (1) යම් ජාතික සංවර්ධන බද්දක් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් ඒ බද්දේ ගණනත්, පැහැර හැරීම කළ තැනැත්තාගේ නම හා ඔහු අන්තිමට පදිංචි ව සිටි බව දැන ගන්නට ලැබුණු ස්ථානයත් නිශ්චය වශයෙන් දැක්වෙන සහතිකයක් පිස්කල් වෙත නිකුත් කළ හැකිය. එවිට පිස්කල් විසින් පැහැර හැරීම කළ තැනැත්තා සතු චංචල දේපළ සියල්ල හෝ එයින් කිසිවක් නැතහොත් එයින් බද්ද අය කර ගැනීම සඳහා අවශ්‍ය වෙතැ යි ඔහු විසින් සැලකිය හැකි කොටසක් තහනමට ගෙන විකිණිය යුතු ය.

(2) යම් ජාතික සංවර්ධන බද්දක් පැහැර හරිනු ලැබ, කොමසාරිස්වරයාගේ මතය අනුව (1) වෙනි ඡේදය යටතේ අය කර ගැනීම කළ නො හැකි වූ හෝ අවස්ථානුකූල නොවූ විටෙක, ඔහු විසින් පැහැර හැරීම කළ තැනැත්තා පදිංචි ව සිටින හෝ පැහැර හැරීම කළ තැනැත්තා සතු යම් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති ප්‍රාදේශීය අධිකරණය වෙත, ඒ බද්දේ ප්‍රමාණයත් පැහැර හැරීම කළ තැනැත්තාගේ නම හා ලිපිනයත් නිශ්චය වශයෙන් දැක්වෙන සහතිකයක් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින්, පැහැර හැරීම කළ තැනැත්තාගේ චංචල හෝ නිශ්චල දේපළ සියල්ල හෝ එයින් කිසිවක් නැතහොත් එයින් බද්ද අය කර ගැනීම සඳහා අවශ්‍ය වෙතැ යි පිස්කල් විසින් සැලකිය හැකි කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල් වෙත බලය පැවරෙන්නා වූ ද නියම කෙරෙන්නා වූ ද ක්‍රියාවේ යෙදවීමේ ආඥාවක් නිකුත් කිරීමට අණ කළ යුතු ය. තවද සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ඒ තහනමට ගැනීමට හා විකිණීමට ද අදාළ විය යුතු ය.

(3) මේ නියෝගයේ කාර්යයන් සඳහා ජාතික සංවර්ධන බද්ද හෝ ඒ බද්දෙහි යම් වාරිකයක් ගෙවීම කළ යුතු ව තුබූ දිනයෙහි දී එය ගෙවනු නො ලැබුවහොත්, ජාතික සංවර්ධන බද්ද පැහැර හරිනු ලැබූ බව සැලකිය යුතු අතර ඒ දිනයෙහි දී ඒ බද්ද හෝ එහි යම් වාරිකයක් ගෙවීම පැහැර හැරි තැනැත්තා ඒ බද්ද හෝ වාරිකය සම්බන්ධයෙන් පැහැර හැරීමක් කළ තැනැත්තකු ලෙස සැලකිය යුතු ය.

6. තැනැත්තකු විසින් ගෙවිය යුතු ජාතික සංවර්ධන බද්දේ ගණනට වැඩියෙන් ඔහු ගෙවූ යම් මුදලක්, ඒ මුදල ගෙවූ දිනයෙන් පසු විසි හතර මසක් ඇතුළත ඒ මුදල ආපසු ගෙවන ලෙස කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින් එය ආපසු ගෙවිය යුතු ය.

7. මේ කොටසේ කාර්යයන් සඳහා—

"පනත" යන්නෙන් 1961 අංක 65 දරන මුදල් පනත අදහස් කෙරෙයි ;

"ව්‍යාපාර" සහ "කොමසාරිස්වරයා" යන පාඨවල අර්ථ පනතෙහි නිරූපිත අර්ථ ම විය යුතු ය;

"ලාංකිකයා" සහ "ලාංකික නොවූ තැනැත්තා" යන පාඨවල අර්ථ පනතෙහි තුන් වෙනි උප ලේඛනයෙහි නිරූපිත අර්ථ ම විය යුතු ය.

ආකෘති පත්‍රය ආර්පීබී 1

### 1961 අංක 65 දරන මුදල් පනත

**ලියාපදිංචි කිරීම සඳහා අයදුම් පත්‍රය**

1.............................................................................. හි

(ඔබේ පදිංචි ස්ථානය දැක්වෙන සම්පූර්ණ ලිපිනය ලොකු අච්චු අකුරෙන් සඳහන් කරන්න)

.................................................................. වන් මම

(පළමු කොට පෙළපත් නාමය යොදා ඔබේ සම්පූර්ණ නම ලොකු අච්චු අකුරෙන් සඳහන් කරන්න)

........................ වර්ෂයෙහි දී ....................................

..................................වශයෙන් වෘත්තියෙහි යෙදීමට/

ව්‍යාපාරය පවත්වා ගෙන යාමට, ලියාපදිංචි කිරීම සඳහා/ ලියාපදිංචි කිරීම අළුත් කිරීම සඳහා මෙයින් ඉල්ලුම් කරමි.

2. අයදුම්කරු සවකීය වෘත්තියෙහි යෙදීම ආරම්භ කළ දිනය : ...................................

3. තත්ත්වය : මා ලාංකිකයකු බව/ලාංකිකයකු නො වන බව ප්‍රකාශ කරමි.

4. ආදායම පිළිබඳ ප්‍රකාශය : මා නියුක්ත ව සිටි වෘත්තියෙන්/ වෘත්තීන්ගෙන්/මා විසින් පවත්වා ගෙන යනු ලැබූ ව්‍යාපාරයෙන්/ව්‍යාපාරයන්ගෙන් ........................ වෙනි දින අවසන් වන වර්ෂය සඳහා පහත දක්වෙන පරිදි වූ ආදායමක් මා ලැබූ බව ප්‍රකාශ කරමි :..........................

(ඔබේ ආදායම සඳහන් කරන්න)

5. ශුද්ධ ධනය පිළිබඳ ප්‍රකාශය :...................... වෙනි දින වන විට මගේ ශුද්ධ ධනය ........................ වූ බව ප්‍රකාශ කරමි.

6. ජාතික සංවර්ධන බද්ද කොටස් වශයෙන් ගෙවීම සඳහා ඉල්ලීම :—

............................ වෙනි දින අවසන් වන වර්‍ෂය සඳහා මගේ වෘත්තියෙන් / වෘත්තීන්ගෙන් / ව්‍යාපාරයෙන් / ව්‍යාපාරයන්ගෙන් ලැබුණු මගේ ආදායම සම්බන්ධයෙන් මගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද එකක් රුපියල් ............... වූ කොටස් ............... කින් (මේ ගණන කොටස් 4ට වැඩි නො විය යුතු ය) ගෙවීම පිණිස මට අවසර දෙන මෙන් ඉල්ලා සිටිමි.

————,
අත්සන.

දිනය :————.

**ආකෘති පත්‍රය ආර්පීබී 2**

## 1961 අංක 25 දරන මුදල් පනත

**ජාතික සංවර්ධන බද්ද කොටස් වශයෙන් ගෙවීමට බාර ගැනීම**

............................ වෙනි දින අවසන් වන වර්‍ෂය සඳහා මගේ ආදායම සම්බන්ධයෙන් මා විසින් ගෙවිය යුතු ජාතික සංවර්ධන බද්ද වන ........................ මුදල පහත සඳහන් පරිදි ගෙවීමට මෙසින් පොරොන්දු වෙමි:—

| මාසය | දිනය | වර්‍ෂය | මුදල |
|---|---|---|---|
| ජනවාරි | — | — | — |
| පෙබරවාරි | — | — | — |
| මාර්තු | — | — | — |
| අප්‍රේල් | — | — | — |
| මැයි | — | — | — |
| ජූනි | — | — | — |
| ජූලි | — | — | — |
| අගෝස්තු | — | — | — |
| සැප්තැම්බර් | — | — | — |
| ඔක්තෝබර් | — | — | — |
| නොවැම්බර් | — | — | — |
| දෙසැම්බර් | — | — | — |

...............දී නියම දිනයෙහි හෝ ඉන් පෙර මුදල් ගෙවනු ලබන අතර, එක් එක් වරට ගෙවූ මුදල ලැබුණු බව දක්වන කුවිතාන්සි, නිල කාර්‍යයීයෙන් පසු ආපසු එවීම සඳහා, ........................වෙත ඉදිරිපත් කරනු ඇත.

........................ වෙනි දින අවසන් වන ලියාපදිංචි කිරීමේ වර්‍ෂය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවූ විට ලැබුණු මගේ කුවිතාන්සිය මේ සමග අමුණා එවමි.

————,
අත්සන.

දිනය :————.

**ආකෘති පත්‍රය : ආර්පීබී 3ඒ**

මුල් පිටපත

## 1961 අංක 65 දරන මුදල් පනත

**වෘත්තියක නියුක්ත වීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ වර්‍ෂය :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව :————.

.................................................මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ ........................ වර්‍ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද........................ ........................මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19........................ මස ................. වෙනි දින වන මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————.

අනු පිටපත

## 1961 අංක 65 දරන මුදල් පනත

**වෘත්තියක නියුක්තවීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ වර්‍ෂය :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව :————.

.................................................මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ ........................ වර්‍ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද........................ ........................මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19........................ මස ................. වෙනි දින වන මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————.

**ආකෘති පත්‍රය ආර්පීබී 3බී**

මුල් පිටපත

## 1961 අංක 65 දරන මුදල් පනත

**ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ වර්‍ෂය :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව :————.

.................................................................................... හි ................................................. මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ............................වර්‍ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද........................ ........................ මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19........................ මස ................. වෙනි දින මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————.

අනු පිටපත

## 1961 අංක 65 දරන මුදල් පනත

**ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ වර්‍ෂය :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව :————.

.................................................................................... හි ................................................. මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ............................වර්‍ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද........................ ........................ මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19........................ මස ................. වෙනි දින මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————.

අනු පිටපත

**ආකෘති පත්‍රය : ආර්පිබී 3 ඒඒ**

අනුක්‍රමික අංකය :————.

**වෘත්තියක නියුක්තවීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ දිනය :————.

ලියාපදිංචි කිරීමේ අංකය : 1961-62ඒ :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව : කිසිත් නොමැත.

.......................................................................... හි

......................................................මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ 196............වර්ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද.........................
.......................මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19..........................මස................. වෙනි දින වන මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————.

අනු පිටපත

**ආකෘති පත්‍රය : ආර්පිබී 3 ඒඒ**

අනුක්‍රමික අංකය :————.

**වෘත්තියක නියුක්තවීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ දිනය :————.

ලියාපදිංචි කිරීමේ අංකය : 1961-62ඒ :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව : කිසිත් නොමැත.

.......................................................................... හි

......................................................මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ 196............වර්ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද.........................
.......................මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19..........................මස................. වෙනි දින වන මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————

අනු පිටපත

**ආකෘති පත්‍රය : ආර්පිබී 3 බීබී**

අනුක්‍රමික අංකය :————.

**ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ දිනය :————.

ලියාපදිංචි කිරීමේ අංකය : 1960-62ඒ :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව : කිසිත් නොමැත.

.......................................................................... හි

......................................................මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ 196............වර්ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද.........................
.......................මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19..........................මස................. වෙනි දින වන මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————.

අනු පිටපත

**ආකෘති පත්‍රය : ආර්පිබී 3 බීබී**

අනුක්‍රමික අංකය :————.

**ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය**

ලියාපදිංචි කිරීමේ දිනය :————.

ලියාපදිංචි කිරීමේ අංකය : 1960-62ඒ :————.

ලියාපදිංචි කිරීමේ ගාස්තුව : කිසිත් නොමැත.

.......................................................................... හි

......................................................මහතා/මහත්මිය/මෙනෙවිය 1961 අංක 65 දරන මුදල් පනත යටතේ 196............වර්ෂය සඳහා ලියාපදිංචි කරනු ලැබ සිටී.

තමාගෙන් ලැබිය යුතු ජාතික සංවර්ධන බද්ද.........................
.......................මහතා/මහත්මිය/මෙනෙවිය ගෙවා ඇත/කොටස් වශයෙන් ගෙවීමට පොරොන්දු වී ඇත.

19..........................මස................. වෙනි දින වන මෙදින දී දිනය යොදන ලදී.

අත්සන :————.

පදවි නාමය :————

5-810

---

ඇල්. ඩී.—බී. 29/61.

අංකය : 965/15/124 (ඇස්බී/ඊ).

## 1961 අංක 65 දරන මුදල් පනත

1961 අංක 65 දරන මුදල් පනතෙහි 31 වෙනි හා 60 වෙනි වගන්ති යටතේ මුදල් ඇමතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962.5.17,
කොළඹ.

**නියෝග**

1. මේ නියෝග 1962 සහල් සහනාධාර බදු නියෝග යනුවෙන් හැඳින්විය හැකි ය.

2. (1) මේ පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු මුදල (242 වෙනි අධිකාරය වන) ආදායම් බදු ආඥා පනත යටතේ ඔහුට නිකුත් කරනු ලැබූ යම් තක්සේරු දැන්වීමක හෝ අතිරේක තක්සේරු දැන්වීමක ඒ සඳහා නියමිත දිනයෙහි හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

(2) ඒ දිනයෙහි හෝ ඊට පෙර මුදල නො ගෙවා ඇති විටෙක, ඒ මුදල පැහැර හැරි මුදලක් ය යි සැලකිය යුතු අතර, (242 වෙනි අධිකාරය වන) ආදායම් බදු ආඥාපනත යටතේ ආදායම් බද්ද අය කළ හැකි ආකාරයෙන් එය අය කර ගත හැකි ය.

(3) (242 වෙනි අධිකාරය වන) ආදායම් බදු ආඥාපනතෙහි අංක 84 සිට 88 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, පැහැර හැරි මුදල අය කර ගැනීමට අදාළ විය යුතු ය.

3. යම් තැනැත්තකුට හිමි විය යුතු සලාක පොත ඒ තැනැත්තාට නිකුත් නො කරන ලද සි දක්වෙන සහතිකයක් ආහාර පාලක හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ යම් නිලධරයකු ඒ තැනැත්තාට නිකුත් කරන විට—

(අ) ඒ සහතිකය සම්පූර්ණ තක්සේරු වර්ෂයකට සම්බන්ධ වේනම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සලාක පොත වෙනුවෙන් පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ කිසි ම මුදලක් ගෙවීමට ඒ තැනැත්තා යටත් නො විය යුතු ය ; තවද

(ආ) තක්සේරු වර්ෂයකට කොටසකට පමණක් ඒ සහතිකය සම්බන්ධ වේ නම්, ඒ සලාක පොත වෙනුවෙන් ඒ තැනැත්තා විසින් 30 වෙනි වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල—ඒ තක්සේරු වර්ෂයේ ඉතිරි කොටසෙහි අඩංගු සම්පූර්ණ සති ගණන 52 සංඛ්‍යාව හා සමග දරන අනුපාතය, තක්සේරු වර්ෂයක් සඳහා සලාක පොතක් වෙනුවෙන් පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල යම් ප්‍රමාණයක් හා සමග දරයි ද—ඒ ප්‍රමාණයේ මුදලක් විය යුතු ය.

4. යම් තක්සේරු වර්ෂයක් ආරම්භ වන දිනයට පෙරාතු ව වූ යම් දිනයක දී ආහාර පාලකට හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ යම් නිලධරයකුට යම් තැනැත්තකු තම සලාක පොත ආපසු භාර දුන හොත්, සහ තම සලාක පොත තමා ආපසු භාර දී ඇතැ යි ද ඒ තක්සේරු වර්ෂයේ දී කිසි ම සලාක පොතක් තමාට නිකුත් නො කරනු ලැබේ ය යි ද දක්වෙන සහතිකයක් ආහාර පාලක විසින් හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ අන් කිසි නිලධරයකු විසින් ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබුවහොත්, ඒ සලාක පොත වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ කිසි ම මුදලක් ගෙවීමට ඒ තැනැත්තා යටත් නො විය යුතු ය.

5. යම් තක්සේරු වර්ෂයක් ආරම්භ වන දිනයට ඉක්බිති ව ම එළඹෙන යම් දිනයක දී ආහාර පාලකට හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ අන් කිසි නිලධරයකුට යම් තැනැත්තකු තම සලාක පොත ආපසු භාර දුනහොත්, සහ තම සලාක පොත ආපසු භාර දී ඇතැ යි ද ඒ තක්සේරු වර්ෂය අවසන් වන තෙක් කිසි ම සලාක පොතක් තමාට යළිත් නිකුත් නො කරනු ලැබේ යයි ද දැක්වෙන සහතිකයක් ආහාර පාලක විසින් හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබුවහොත්, ඒ සලාක පොත වෙනුවෙන් ඒ තැනැත්තා විසින් පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල—සලාක පොත ආපසු භාර දුන් දිනයෙහි ආරම්භ වන තක්සේරු වර්ෂයේ කොටසෙහි අඩංගු සම්පූර්ණ සති ගණන 52 සංඛ්‍යාව හා සමග දරන අනුපාතය, තක්සේරු වර්ෂයක් සඳහා සලාක පොතක් සම්බන්ධයෙන් පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල යම් ප්‍රමාණයක් හා සමග දරයි ද—ඒ ප්‍රමාණයේ මුදලක් විය යුතු ය:

එ සේ වුව ද ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබූ සහතිකයෙහි නියමිත ව ඇත්තා වූ ද ඒ තක්සේරු වර්ෂයෙහි අඩංගු වූ ද සම්පූර්ණ සති ගණනට ඒ සලාක පොත සම්බන්ධයෙන් වූ සහල් සලාක, ඒ සලාක පොත ආපසු භාර දුන් දිනයට පෙරාතුව, ඒ තැනැත්තා ලබා නො ගෙන ඇතැ යි ආහාර පාලක හෝ ඒ සඳහා බලය පවරනු ලැබූ යම් නිලධරයකු ඒ සහතිකයෙහි සඳහන් කළ අවස්ථාවක, ඒ සහතිකයෙහි නියමිත සම්පූර්ණ සති ගණන 52 සංඛ්‍යාව හා සමග දරන අනුපාතය, තක්සේරු වර්ෂයක් සඳහා සලාක පොතක් සම්බන්ධයෙන් පනතෙහි 30 වෙනි වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල යම් ප්‍රමාණයක් හා සමග දරයි ද, මේ නියෝගයෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල ඒ ප්‍රමාණයේ මුදලකින් අඩු කළ යුතු ය.

6. සහනාය සඳහා යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් සනාථ කිරීම පිණිස කොමසාරිස් සෑහීමට පත් වන පරිදි ඒ තැනැත්තා සාක්ෂි ඉදිරිපත් නො කළහොත්, ඒ ඉල්ලීමට ඉඩ නො දිය යුතු ය.

7. මේ නියෝගයෙහි—

"පනත" යන්නෙන් 1961 අංක 65 දරන මුදල්, පනත අදහස් වේ; තවද

"කොමසාරිස්" යන්නට පනතෙහි දී ඇති අර්ථය ම ලැබිය යුතුය.

5-809

---

ඇල්.ඕ.—බී. 33/44.

අංකය : 34/2/11 (ඒ සී).

## මුදල් බදු ආඥා පනත

### 79 වෙනි වගන්තිය යටතේ නියෝගය

මුදල් බදු ආඥා පනතේ (241 අධිකාරය) 79 වෙනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සම්පාදිත ව, ඒ වගන්තියේ (4) වෙනි උප වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝගය.

ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 මැයි 21 දින,
කොළඹ දීය.

**නියෝගය**

1944 ජූනි 19 වැනි දින අංක 9,284 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, 1961 ඔක්තෝබර් 20 වැනි දින අංක 12,726 දරන ගැසට් පත්‍රයේ පළ වූ නියෝගයෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද්දා වූ 1944 මුදල් බදු (ආණ්ඩුවේ ස්කන්ධ ආපසු භාර දීමෙන් ගෙවීම් පිළිබඳ) නියෝග, එකී නියෝග වලට යාකොට ඇති උප ලේඛනය පහත සඳහන් පරිදි වෙනස් කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) 67 වෙනි විෂයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් විෂයයන් ඒ එක් එක් විෂයයෙහි ඇතුළත් විස්තර එම උප ලේඛනයෙහි සුදුසු තීරුවල සටහන් වන ලෙස එකතු කිරීමෙන් :—

68. සම මිලට නිකුත් කළ ලංකාණ්ඩුවේ $4\frac{1}{4}\%$ ණය, "සී" කාණ්ඩය, 1982—86,

69. සම මිලට නිකුත් කළ ලංකාණ්ඩුවේ $4\frac{1}{4}\%$ ණය, "ඩී" කාණ්ඩය, 1982—86,

70 සම මිලට නිකුත් කළ ලංකාණ්ඩුවේ $4\frac{1}{4}\%$ ණය, "ඊ" කාණ්ඩය, 1982—86,

71. සම මිලට නිකුත් කළ ලංකාණ්ඩුවේ 3% ණය, 1964—66,

72. සම මිලට නිකුත් කළ ලංකාණ්ඩුවේ $4\frac{1}{4}\%$ ණය, "එෆ්" කාණ්ඩය, 1982—86."

තව ද,

(ආ) පහත සඳහන් විෂයය, ඒ එක් එක් විෂයයට ඇතුළත් එම විස්තර එම උප ලේඛනයෙහි සුදුසු තීරු වලින් ඉවත් කෙරෙන ලෙස අස් කිරීමෙන් :—

"36. අව මිලට නිකුත් කළ ලංකාණ්ඩුවේ $3\frac{1}{2}\%$ ණය, 1959—61...100."

6-37

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරලේ (මැදපත්තුව) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි අළුත්ගම ගම්ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් කරමි :—

(1) කලගෙඩිහේන පදිංචි පරාක්‍රම ප්‍රසන්න සිරිවර්ධන මහතා,

(2) කරණායකමුල්ල පදිංචි එදිරිපස්ස පේඩිගේ ගුණසේකර මහතා,

(3) කරණායකමුල්ල පදිංචි විජයසිංහ පේඩිගේ ජයසේන මහතා,

(4) කත්තොට පදිංචි රත්නායක රාළලාගේ යොහානිස් මහතා,

(5) කලෝටුවාව පදිංචි ජයසේකර සුබසිංහ ආරච්චිගේ දොන් විලියම් ජයවර්ධන මහතා,

(6) බෝගොඩ පදිංචි විජේසුන්දර රණසිංහ උඩුමුල්ලගේ දොන් එඩ්මන් විජේසුන්දර මහතා,

(7) වීරගුල පදිංචි ජයසුන්දර පතිරන්නැහැලාගේ ධම්දාස මහතා,

(8) තිහාරිය පදිංචි අබ්දුල් අසීස් මහමූද් මහතා,

(9) තිහාරිය පදිංචි හේවාතන්ත්‍රිගේ මිගෙල් පීරිස් කුලතිලක වීරසූරිය සෙනවිරත්න මහතා,

(10) තිහාරිය පදිංචි එදිරිසූරිය මුදලිගේ විලී පීටර් එදිරිසූරිය සිරිවර්ධන මහතා,

(11) කිරිකිත්තමුල්ල පදිංචි ගල්ලන්න දේවගේ මැන්ඩිස් මහතා,

(12) වීදියවත්ත පදිංචි මෙනේරිගමගේ හෙන්රි ලෙස්ලි පෙරේරා අභයගුණරත්න මහතා,

(13) යක්කල පදිංචි ජයමාන්න මොහොට්ටිගේ දොන් හැන්රි ජයමාන්න මහතා,

(14) පහලවීදියවත්ත පදිංචි අදිකාරිඅප්පුහාමිල්ලාගේ චාර්ලිස් අප්පුහාමි මහතා,

(15) අලුත්ගම පදිංචි තිත්තලපිටියේ හරිස්චන්ද්‍ර කරුණාතිලක මහතා,

(16) තිහාරිය පදිංචි පලමෙනි ආරච්චිගේ සිමියොන් පෙරේරා මහතා,

(17) තිහාරිය පදිංචි රාජපක්ෂ පතිරන්නැහැලාගේ ඩේවිඩ් අප්පුහාමි මහතා,

(18) තිහාරිය පදිංචි පලමෙනි ආරච්චිගේ විමලදාස පෙරේරා මහතා,

(19) මංගලතිරිය පදිංචි රාජපක්ෂ රණතුංග ආරච්චිගේ දොන් සලමන් එඩ්මන් ජයවර්ධන මහතා,

(20) බෝගමුව පදිංචි ජයකොඩි මොහොට්ටි අප්පුහාමිල්ලාගේ සේදිරිස් අප්පුහාමි මහතා,

(21) අළුත්ගම පදිංචි ජේ. පී. පී. දබරේ මහතා,

(22) බෝගොඩ පදිංචි නිශ්ශංක බමුණු ආරච්චිගේ ගුණරත්න නිශ්ශංක මහතා,

(23) වීරගුල පදිංචි ආරච්චි අප්පුහාමිල්ලාගේ කරුණාසේකර මහතා,

(24) අළුත්ගම-බෝගමුව පදිංචි කුරුප්පු අප්පුහාමිල්ලාගේ දොන් ඒබ්‍රහම් අප්පුහාමි මහතා,

(25) බෝනැගල පදිංචි රණතුංග ආරච්චිගේ ඒමිස් සිංඤෝ මහතා,

(26) කටුවස්ගොඩ පදිංචි මෙරගල් පේඩිගේ ප්‍රේමදස මහතා,

(27) උඩතුත්තිරිපිටිය පදිංචි අමරසිංහ ලේකම්ලාගේ ජාන් සිංඤෝ මහතා,

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් කලගෙඩිහේන පදිංචි පරාක්‍රම ප්‍රසන්න සිරිවර්ධන මහතා පත්කරමි; තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2 ක් විය යුතුයයි නිශ්චය කරමි.

සෑම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 මැයි මස 25 වෙනි දින,
කොළඹ දීය.

6-253

---

ඇල්.ඩී.–බී. 237/30. මු.ලේ.අංකය : 79/20/27/වීසී(II)

## ජනලේඛන ආඥපනත

143 වෙනි අධිකාරය වන ජනලේඛන ආඥපනතෙහි 2 වෙනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

fපීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962.5.28,
කොළඹ දී ය.

### ආඥාව

ලංකා වාසීන්ගේ සමාජයීය, පොදු හා ආර්ථික තත්වයන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා එක්දහස් නවසිය හැට තුනේ වර්ෂයේ දී දිවයිනේ ජනගහණය සහ නිවාස පිළිබඳ ලේඛනයක් ගතයුතු බව මෙයින් නියම කරනු ලැබේ.

6–263/1

---

මු.ලේ. අංකය : 79/20/27/වීසී (II).

නි. කෙ. අංකය.

## ජනලේඛන ආඥපනත

වර්ෂ 1962 ක්වූ ජූනි මස 1 වැනි දින අංක 13,145 දරණ ගැසට් නිවේදනයෙන් මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද ආඥාව පරිදි වර්ෂ 1963 දී ගතයුතු යැයි නියමිත සංගණනය පරිපාලනය කිරීම පිණිස සංගණන අධිකාරි හැටියට වැඩබලන ජනලේඛන හා සංඛ්‍යා ලෙඛන අධ්‍යක්ෂ ඇලන් බැසිල් සැමුවෙල් නේසරාජා පුල්ලෙනායගම් මහතා ජනලෙඛන ආඥපනතේ (143 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන්නට යෙදුනා ඇත.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්

1962 මැයි මස 28 වැනි දින,
කොළඹදීය.

6–263/2

---

## දැන්වීමයි

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සන්ගරපිල්ලෙයි යෝගරාජ් මහතා විසින් නොතාරිස් වරුන් පිළිබඳ (පරිච්ඡෙද අංක 107 දරණ) ආඥ පනතේ 22 (1) වගන්තිය යටතේ 1961ක්වූ දෙසැම්බර් මස 19 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, එකී දින සිට, එම ඉල්ලා අස්වීම් භාරගෙන තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962ක්වූ මැයි මස 14 වැනි දින,
කොළඹදීය.

6-135

---

## දැන්වීමයි

කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඇන්තනි ජේරල්ඩ් මැනුවෙල් මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡෙද අංක 107 දරණ) ආඥපනතේ 22 (1) වගන්තිය යටතේ 1961ක්වූ නොවැම්බර් මස 30 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස් වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962ක්වූ මැයි මස 14 වැනි දින,
කොළඹදීය.

6-167

---

## දැන්වීමයි

පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂා වන්ගෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් මහමඩචිගේ ජේම්ස් වික්මන් සිල්වා මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡෙද අංක 107 දරණ) ආඥ පණතේ 22 (1) වගන්තිය යටතේ 1962 ක්වූ ජනවාරි මස 1 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලාඅස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ක්වූ මැයි මස 14 වැනි දින,
කොළඹ දීය.

6-166

---

ඇල්. සී—ඇල්. ඩී/344.

එල්. ඩී.—බී 40/34.

## කැළෑ ආඥපනත

කැලෑ ආඥපනතේ (451 වෙනි අධිකාරය) 4 (2) වෙනි වගන්තී යෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වරයා විසින් පනවනු ලබන ආඥාවයි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962. 5. 15,
කොළඹදී ය.

### ආඥාව

1893 සැප්තැම්බර් 8 වෙනි දින හා අංක 5,241 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1893. 8./21 දින දරන ප්‍රකාශනයෙන් රක්ෂිත කැළයක් වශයෙන් සංස්ථාපනය කොට නාරියගම-මානුවන්ගම රක්ෂිත වනය නමැති හා එනමින් හඳුන්වනු ලබන, ඉඩමේ මෙහි උප ලේඛනයෙහි නියමිත කොටස මෙහි සඳහන් දින සිට රක්ෂිත භූමියක් නොවිය යුතුය.

### උපලේඛනය

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරලයේ දකුණු මුන්නේසරම් පත්තුවේ මානුවන්ගම ගමේ පිහිටි කැ. මැ. මු. පී. 120 කැබලි අංක 2 සහ 5 වශයෙන් මැන පෙන්නුම් කොට ඇති අක්කර 107, රූඩ් 1, පර්චස් 32 කින් යුත් නාරියගම-මානුවන්ගම රක්ෂිත කැළයේ කොටස.

6-23

---

ඇල්. සී.—ඇල්. ඩී/345.

## කැළෑ ආඥපනත

කැළෑ ආඥපනතෙහි (451 වෙනි අධිකාරය) 4 (2) වෙනි වගන්තී යෙන් කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවනු ලැබූ ආඥාවයි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

1962.5.12 කොළඹදීය.

### ආඥාව

1937 මාර්තු මස 5 වෙනි දින හා අංක 8,275 දරන ගැසට් පත්‍රයෙහි පළවූ ප්‍රකාශනයෙන් රක්ෂිත කැළයක් වශයෙන් සංස්ථාපනය කොට ඇති කිරිදිගල්ල රක්ෂිත කැළය නමැති හෝ එනමින් හඳුන්වනු ලබන ඉඩමේ මෙහි උපලේඛනයෙහි නියමිත කොටස මෙහි සඳහන් දින සිට රක්ෂිත භූමියක් නොවිය යුතුය.

### උපලේඛනය

වයඹ පළාතේ අංක 1169 දරන අවසාන ගම් පිඹුරෙහි 38 වෙනි බිම් කැබැල්ලෙහි ඇතුළත් වූ, අක්කර 2, රූ. 3, පර්. 30කින් යුත්—

උතුරට : වයඹ පළාතේ 1169 වෙනි අවසාන ගම් පිඹුරෙහි 39 වෙනි බිම් කැබැල්ලෙන් ද ;

නැගෙනහිරට : කිරිදිගල්ල ගම් සීමාවෙන් ද ;
දකුණට සහ බස්නාහිරට : වයඹ පළාතේ 1168 වෙනි අවසාන ගම් පිඹුරෙහි 40 වෙනි බිම් කැබැල්ලෙන් ද,

මායිම්වූ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ බටහිර ඉහළ විසිදෙකේ කෝරළේ පනාගමුව ගමේ පිහිටි, කිරිදි ගල්ල රක්ෂිත කැළයට ඇතුළත් පනාගමුවේ මූකලාන නැමැති සම්පූර්ණ ඉඩම.

6-64

---

ඇල්. ඞ්/ඞී. 77/33

### රජයේ ඉඩම් ආඥාපනත

කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල පිළිබඳ ඇමති තැන්පත් චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, රජයේ ඉඩම් ආඥාපනතේ (454 වෙනි අධිකාරය) 63 වන වගන්තියේ (1) උප වගන්තියේ ප්‍රකාර මට පැවරී ඇති බලතල අනුව 1953 නොවැම්බර් 27 වන දින හා අංක 10616 දරණ ගැසට් නිවේදනයේ පළවූ ඇන්වීමේ උප ලේඛනය වෙනුවට මෙහි පහත සඳහන් උපලේඛනය ආදේශ කරමින් සංශෝධනය කරමි.

" උපලේඛනය

අංක ඇල් 22/49 2 නැගෙනහිර සහ ඇල් 22/49 4 නැගෙනහිර දරණ කලුතර නගර මැණිමේ සිතියමේ අංක 253 දරණ ඉඩම් කට්ටියට දකුණින් ඇති වැලිකන්ද හැර කලුතර නගර සභා පරිපාලන සීමාව තුළ ඇති මුහුදු වෙරළ."

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමති.

1962.5.3 දින කොළඹදීය.

6-65

---

ඇල්.සී—ඇල්.ඞී/115.

### කැලෑ ආඥාපනත

කැලෑ ආඥාපනතෙහි (451 වෙනි අධිකාරය) 4 (2) වෙනි වගන්තියෙන් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවනු ලැබූ ආඥාවයි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

1962.5.3
කොළඹදීය.

### ආඥාව

1937 පෙබරවාරි 17 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් රක්ෂිත කැළයක් වශයෙන් සංස්ථාපනය කරනු ලැබ, 1937 මාර්තු 5 වෙනි දින හා අංක 8,275 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ, දවටගොල්ල රක්ෂිත කැළය නැමැති හා එනමින් හඳුන්වනු ලබන ඉඩමේ මෙහි උපලේඛනයෙහි නියමිත කොටස මෙහි සඳහන් දින සිට රක්ෂිත භූමියක් නොවිය යුතුය.

### උපලේඛනය

අංක 468 දරණ අවසාන ගම් පිඹුරෙහි අංක 2 දරණ අතිරේකයෙහි 73 වෙනි බිම් කැබැල්ලෙහි (අංක 99 දරණ කැලෑ මිනුමේ මූලික පිඹුරේ 1 වෙනි බිම් කැබැල්ලෙන් කොටසක්) ඇතුළත් වූ අක්කර 2, රූ. 0, පර්. 18කින් යුත්,—

උතුරට : 468 වෙනි අ. ග. පි. 47ඒ බිම් කැබෙල්ලෙන් ද ; නැගෙනහිරට : 99 කැ. මි. මු. පි. 1 වෙනි බිම් කැබෙල්ලෙන් ද ; දකුණට : 99 කැ. මි. මු. පි. 1 වෙනි බිම් කැබෙල්ලෙන් ද ; බටහිරට : 99 කැ. මි. මු. පි. 1 වෙනි බිම් කැබෙල්ලෙන් සහ 468 වෙනි අ. ග. පි. 47බී වෙනි බිම් කැබෙල්ලෙන් ද මායිම් වූ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ දකුණු උඩකඟ කෝරළේ පරමඋල්ල ගමේ පිහිටි දෙවටගොල්ල හේන නැමැති සම්පූර්ණ ඉඩම.

6-71

### 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන පනත

#### 25 (1) වෙනි වගන්තිය යටතේ කෙරෙන නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනාකර ඇත්තාවූද, නිශ්චල දේපළ අත්කර ගැනීම, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් රථ ගමනාගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති.

1962ක්වූ මැයි මස 15 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බටහිර ගිරුවාපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මන්දාදුව ගම්මුලාදෑනි කොටසේ, වීරකැටියගොඩ ගමේ පිහිටි, ඒකාබද්ධ බිම් කැබලි තුනක්. වර්ග ප්‍රමාණයෙන් අක්කර 3ක් පමණ.

2. (ඒ) සහ (බී) කැබලි :—

උතුරට : ප්‍රධාන පාර සහ එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස, බස්නැවතුම්පොළ සහ ස්ටෙලා කුලතිලකට අයිති ඉඩම ; දකුණට : ස්ටෙලා කුලතිලකට අයිති ඉඩම ; බස්නාහිරට : උඩුකිරිවෙල වැව.

(සී) කැබැල්ල :—

උතුරට : දොන් හෙන්ද්‍රික් ගලගම සහ වෙනත් අයට අයිති ඉඩම ; නැගෙනහිරට සහ දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : උඩුකිරිවෙල වැව.

3. අත්කර ගැනීමට ඇති ඉඩම් කැබලිවල විස්තර මෙසේය :—

(ඒ) සහ (බී) කැබලි :—

ඉඩමේ නම : නමක් නොමැතියි ; වගාව : ප්‍රධාන වශයෙන් කෙසෙල් වගාකල වත්ත ; වර්ග ප්‍රමාණය : අක්කර 1ක් පමණ ; අයිතිකරුවන්ගේ නම් සහ ලිපින : දොන් හෙන්ද්‍රික් ගලගම සහ වෙනත් අය, මන්දාදුව.

(සී) කැබැල්ල :—

ඉඩමේ නම : නමක් නොමැතියි ; වගාව : මුඩු බිම ; වර්ග ප්‍රමාණය : අක්කර 2ක් පමණ ; අයිතිකරුගේ නම සහ ලිපිනය : ස්ටෙලා කුලතිලක, මාතර.

6-51

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

#### 49 ඒ. දරණ ඡේදය යටතේ ප්‍රකාශනයයි

. පළාත් පාලන සහ නිවාස ඇමතිවර මහානාම සමරවීර වන මම, 1958 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49ඒ. (1) (c) ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මේ සමග ඇති උපලේඛනයෙහි විස්තර කර ඇති ස්ථානය එම ඡේදයෙහි සඳහන් අරමුණ සඳහා අත්කර ගැනීමට අවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා,

1962 මැයි මස 17 වැනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 719 දරණ කොහොලාන ගම්මුලාදෑනි වසමේ පිහිටි ඉහළවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 47 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : පස්මෙගොඩ වත්ත ; දකුණට : උඩලයාවත්ත ; බස්නාහිර : උඩලයාවත්ත සහ කරත්ත පාර.

6-25

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 මැයි මස 17 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මරදාන ගම්මුලාදෑනි වසමේ ශ්‍රී සංඝරාජ මාවතේ වරිපනම් අංක 541 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 4ක් පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 551 සහ 222 ; නැගෙනහිරට : ශ්‍රී සංඝරාජ මාවත ; දකුණට : වරිපනම් අංක 443, 441/5, 441/5ඒ, 441/5බී, 441/6, 441/7, 441/8, 441/9 සහ 441/10 ; බස්නාහිරට : අබ්දුල් හමීඩ් වීථියේ වරිපනම් අංක 192/1 සහ 192/1ඒ.

6-30

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා,

1962 මැයි මස 17 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලයේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ඇල්පිටිය වසම ගම්මුලාදෑනි වසමේ පිහිටි නාරංගොඩ වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 1½ ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : පුද්ගලික කුඹුරු ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : එම ඉඩමේ ඇති ඇල.

6-33

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 මැයි මස 23 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, වත්තේගම ගම්මුලාදෑනි වසමේ පිහිටි ගල්ගොඩවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 17ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ෆ්‍රැන්ක්ලන් ඩිස් වත්ත සහ විහාර කුඹුර ; නැගෙනහිරට : විහාර කුඹුර ; දකුණට : විහාර කුඹුර ; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස හා ෆ්‍රැන්ක්ලන් ඩිස් වත්ත.

6-76

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### ඡන්දදායක නාම ලේඛන සංශෝධනය—1962

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 16 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, 1962 වර්ෂය සඳහා ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම ආරම්භ කර ඇති බව ය.

2. දැනට වලංගුව ඇති ඡන්දදායක නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ලියා පදිංචි කිරීමේ නිලධාරින් විසින් මෙහි පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කරවනු ලැබේ.

| නාමලේඛන හෝ ඒවායේ කොටස් ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල | ප්‍රදර්ශනය කරනු ලබන නාමලේඛන හෝ ඒවායේ කොටස්වල විස්තර |
|---|---|
| (1) රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය. | අංක 1-උතුරු කොළඹ, අංක 2-මැද කොළඹ, අංක 3-බොරැල්ල, අංක 4-දකුණු කොළඹ සහ අංක 19-දෙහිවල-ගල්කිස්ස යන මැතිවරණ කොට්ඨාශවල නාමලේඛනවල සම්පූර්ණ පිටපත්. |
| (2) කච්චේරිය | ආණ්ඩුවේ දිසාපතිවරයා ලියා පදිංචි කිරීමේ නිලධාරි තැන වශයෙන් ඇති සෑම මැතිවරණ කොට්ඨාශයකම නාම ලේඛනවල සම්පූර්ණ පිටපත්. |
| (3) ප්‍රාදේශික බල මණ්ඩල කාර්යාලය. | ප්‍රාදේශික බලමණ්ඩල ප්‍රදේශය තුළ වෙසෙන සියළුම ඡන්දදායකයන්ගේ නම් ඇතුලත් නාමලේඛන කොටස. |
| (4) තැපැල් කන්තෝරුව. | තැපැල් කන්තෝරුව පිහිටා ඇති ඡන්ද කොට්ඨාශය තුල වෙසෙන සියළුම ඡන්දදායකයන්ගේ නම් ඇතුලත් නාමලේඛන කොටස. |
| (5) එක් එක් ගම්මුලාදෑනි කාර්යාලය. (කච්චේරියක් පිහිටා ඇති යම්කිසි නගරයක් තුල සහ කොළඹ සහ දෙහිවල-ගල්කිස්ස යන මහා නගර සභා ප්‍රදේශවල පිහිටි ගම්මුලාදෑනි කාර්යාල හැර) | ගම්මුලාදෑනි කොට්ඨාශය තුල වෙසෙන සියළුම ඡන්දදායකයන්ගේ නම් ඇතුලත් නාමලේඛන කොටස. |

3. අංක 1-උතුරු කොළඹ, අංක 2-මැද කොළඹ, අංක 3-බොරැල්ල, අංක 4-දකුණු කොළඹ සහ අංක 19-දෙහිවල-ගල්කිස්ස යන මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායකයකු වීමට සුදුසුකම් ඇති සෑම කෙනෙකු විසින් ම තම තමන්ගේ නම් ඡන්දදායක නාමලේඛනයට ඇතුලත් වී තිබේ දැයි එකී මැතිවරණ කොට්ඨාශවල නාමලේඛන පිටපත් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී හෝ ඒවායේ අදාල කොටස් සවකීය ප්‍රදේශයේ ප්‍රාදේශික බලමණ්ඩලීය කාර්යාලයේ දී හෝ තැපැල් කාර්යාලයේ දී හෝ කාර්යාල වේලාවන්හි දී පරීක්ෂා කර බලා නිසැකව දැන ගත යුතු වන අතර,

අනිත් යම්කිසි මැතිවරණ කොට්ඨාශයක ඡන්දදායකයකු වීමට සුදුසුකම් ඇති සෑම දෙනෙකු විසින් ම තම තමන්ගේ නම් ඡන්දදායක නාම ලේඛනයට ඇතුලත් වී තිබේ දැයි සවකීය කච්චේරියේ දී නාමලේඛනය හෝ තත් ප්‍රදේශීය ප්‍රාදේශික බලමණ්ඩලීය කාර්යාලයේ දී හෝ ගම්මුලාදෑනි කාර්යාලයේ දී හෝ තැපැල් කාර්යාලයේ දී ඒ ඒ ප්‍රදේශයට අදාල නාම ලේඛන කොටස් හෝ කාර්යාල වේලාවන්හි දී පරීක්ෂා කර බලා නිසැකව දැන ගත යුතු වේ.

4. නාමලේඛනය හෝ එහි කොටසක් පරීක්ෂාකර බැලීමේදී සවකීය නම එහි ඇතුලත් වී නොමැති බැව් පෙනී ගිය හැම දෙනෙකු විසින් ම, තම තමන්ගේ නම් එහි ඇතුලත් කරවා ගත යුතුය.

(අ) අංක 1-උතුරු කොළඹ, අංක 2-මැද කොළඹ, අංක 3-බොරැල්ල අංක 4-දකුණු කොළඹ සහ අංක 19-දෙහිවල-ගල්කිස්ස යන මැතිවරණ කොට්ඨාශ සම්බන්ධයෙන් නම් :—

(i) මෙම දැන්වීමට යාකොට තිබෙන ආකෘතිය අනුව ලියන ලද ඉල්ලුම් පත්‍රයක්, 1962 ජූනි 29 වැනි දිනට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සහ ;

(ii) ඊට අතිරේකව, ඡන්දදායකයකු ලෙස ලියා පදිංචි කිරීමට ඇති සෑම සුදුසුකමක් ම පිළිබඳ සියළු තොරතුරු ගණන් ගන්නා නිලධාරියකු විසින් තමන් වෙත සපයනු ලබන යම්කිසි විශේෂ ආකෘතියක් මත සැපයීම සහ මෙම අවුරුද්දේ නාමලේඛන සංශෝධනය සම්බන්ධයෙන් ඡන්දදායකයන් හැටියට සුදුසු වූවන්ගේ නම් හා නුසුදුසුවූවන්ගේ හෝ මියගිය අයගේ නම් විමසා බැලීම පිණිස එක් එක් ගෙදරට පැමිණෙන ගණන් ගැනීමේ නිලධාරියකු විසින් විමසනු ලබන තොරතුරු සැපයීම ද කළ යුතුවේ.

(ආ) වෙනයම් කිසි මැතිවරණ කොට්ඨාශයක් සම්බන්ධයෙන් නම් :—

(i) මෙම දැන්වීමට යාකොට තිබෙන ආකෘතිය අනුව, ලියන ලද ඉල්ලුම් පත්‍රයක් 1962 ජූනි 29 වැනි දිනට පෙර තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන වෙත ඉදිරිපත් කිරීම සහ,

(ii) ඊට අතිරේකව, ඡන්දදායකයකු ලෙස ලියා පදිංචි කිරීමට ඇති සැම සුදුසුකමක් ම පිළිබඳ සියළු තොරතුරු ගණන් ගන්නා නිලධාරියකු විසින් තමන් වෙත සපයනු ලබන යම්කිසි විශෙෂ ආකෘතියක් මත සැපයීම සහ මෙම අවුරුද්දේ නාමලේඛන සංශෝධනය සම්බන්ධයෙන් ඡන්දදායකයන් හැටියට සුදුසු වූවන්ගේ නම් හා නුසුදුසුවූවන්ගේ හෝ මියගිය අයගේ නම් විමසා බැලීම පිණිස එක් එක් ගෙදරට පැමිණෙන ගණන් ගැනීමේ නිලධාරියකු විසින් විමසනු ලබන තොරතුරු සැපයීම ද කළ යුතුවේ.

5. නාමලේඛන හෝ ඒවායේ කොටස් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම කායඹාලයකින් ඉල්ලුම් පත්‍ර පිළිබඳ ආකෘති පිටපත් ලබාගත හැකි වේ.

ඊ. ඈෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

1962 මැයි 31 වැනි දින,
කොළඹ දී ය.

**1962 වර්ෂයට ඡන්දදායකයකු වශයෙන් ලියා පදිංචිවීම සඳහා ඉල්ලුම් පත්‍රයයි**

රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා :—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි තුමා :—

........................................................................ වන මා

........................................................................මැතිවරණ කොට්ඨාශයේ ඡන්දදායකයකු වශයෙන් ලියා පදිංචි කරන මෙන් මෙයින් ඉල්ලා සිටිමි.

මගේ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් තොරතුරු සපයන්නෙමි :—

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. වයස :————.
4. මැතිවරණ කොට්ඨාශය තුළ පදිංචියට පැමිණි දිනය සහ එසේ පදිංචිව සිටි කාලය :————.

දිනය :— ........................ ........................ ඉල්ලුම්කරුගේ අත්සන.

6-4

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 15/62 දරන ආනයන පාලන දැන්වීම

### මුද්‍රණ සහ ලියන කඩදාසි ආනයනයන්

මුද්‍රණ සහ ලියන කඩදාසි බලපත්‍ර පාලනයට ගෙන ආ අංක 4/62 දරන ආනයන පාලන දැන්වීමට ආනයනකයන්ගේ අවධානය යොමු කෙරේ.

2. පහත සඳහන් කඩදාසි වර්ගයන් සඳහා නිදහස් ලෙස බලපත්‍ර නිකුත් කෙරෙනු ඇත :—

(1) Air Mail Paper
(2) Art Paper
(3) Cheque Paper
(4) Chromo Paper
(5) Ferro Prussiate Paper
(6) Gevacopy Paper
(7) Helio Print Paper
(8) Ledger Paper
(9) Litho Printing Paper
(10) M. G. Sulphite Paper
(11) Ozalid Printing Paper
(12) Poster Paper
(13) Super Calendered Paper
(14) Vellum/Parchment Paper
(15) Antique Paper
(16) Imitation Art Paper
(17) Machine Coated Paper
(18) Chromo Label Paper
(19) Chromo Art Paper
(20) Catridge Paper
(21) M. G. Manila
(22) Teleprinter Paper
(23) Air Conqueror, Blue White Onion Skin Finish Paper
(24) Coated Paper
(25) One Sided Coated Paper
(26) Offset Printing Paper.

3. බලපත්‍ර නිකුත් කිරීම පහසු කරනු වස් ඉන්වොයිසිවල අදාල කඩදාසිවල පැහැදිලි සහ සම්පූර්ණ විස්තරයක් ඉන්වොයිසිවල සඳහන් විය යුතුය.

4. පහත සඳහන් කඩදාසි වර්ග ද දැනට ඇති රෙගුලාසි අනුව, විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ පවතින බව සාමාන්‍ය දැනගැනීම සඳහා නිවේදනය කරනු ලැබේ :—

Cloth-lined Paper for Maps and Charts, Tissue Paper, Glassine Paper, Cellophane Paper, Drawing Paper, Blotting Paper, Marble Paper, Leatherette Paper, Brown-Kraft Paper, Flint Paper, Gum Paper, *Linen faced* Cover Paper, *Embossed* Cover Paper, Oil Paper, Grease Proof Paper.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 මැයි මස 22 වෙනි දින,
කොළඹ 3, ආනයන හා අපනයන පාලන
දෙපාර්තමේන්තුවේ දී ය.

6-237

## අංක 6/62 දරණ අපනයන පාලන දැන්වීම

### ගෙඩි පොල් අපනයනය

1962 ජනවාරි මස 18 වෙනි දින අංක 12,881 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1/62 දරන අපනයන පාලන දැන්වීමට වැඩිමනත්වය. 1962 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වන තවත් 6 මසක කාලපරිච්ඡේදයක් සඳහා ගෙඩිපොල් අපනයනයට ඉඩ දෙන බව අපනයනකයන් වෙත මෙයින් දැනුම් දෙමි.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 මැයි මස 24 වෙනි දින,
කොළඹදීය.

6-122

රෝ. ආ. 40අ.

## 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත

### 277 (5) වගන්තිය යටතේ සීමාසහිත විජේසූරිය එස්වේස් නම කපා හැරීම දැන්වීම

1938 අංක 51 දරණ සමාගම් ආඥා පනතේ විධි විධාන යටතේ 1958 පෙබරවාරි මස 27 වැනි දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත විජේසූරිය එස්වේව්ස් ව්‍යාපාරික කටයුතු වල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදක්වුවහොත්, එ දින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සීමාසහිත විජේසූය එස්වේව්ස් නාම රෙජිස්ටරයෙන් කපා හරින බවට 1962.2.23 වැනි දින අංක 12,937 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්, 1962.2.12 වැනි දින දරණ දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත විජේසූරිය එස්වේව්ස් ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමාසහිත විජේසූරිය එස්වේව්ස් නම සමාගම් රෙජිස්ටර යෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බව ද, වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
1962 ක්වූ මැයි මස 17 වැනි දින කොළඹ දීය.
6-123

## කෑ/නක්කාවිට සිරිනාලන්දා පිරිවෙන, දූරණියගල

කෑගලු දිස්ත්‍රික්කයේ අටුළුගම් කෝරළේ නක්කාවිට පිහිටි සිරිනාලන්දා පිරිවෙන ආධාර ලබන පිරිවෙනක් ලෙස තාවකාලික වශයෙන් 1.3.60 දින සිට ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

අංක : ඊ. එස්. බී. 14.
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1962 අප්‍රේල් මස 27 වැනි දින.

6-24

## දැන්වීමයි

**කො/විද්‍යාවංශ පිරිවෙන, බණ්ඩාරවත්ත, ගම්පහ**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ගම්පහ, බණ්ඩාරවත්තෙ පිහිටි ඉහත සඳහන් පිරිවෙන ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියා පදිංචි කිරීමට අම්තිරිගල පඤ්ඤාවංශ ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇත්නම් මා වෙත දැන්විය යුතුය..

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ඊ, ඇස්. බී. 36,
1962 ක්වූ මැයි මස 7 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

6-32

## දැන්වීමයි

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත නැගෙනහිර කරවන ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ තුලාන 22ඒ කොට්ඨාශයේ කුරුන්දන්කුලම ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 මාර්තු 16 දින අංක 12,986 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 මැයි 21 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායඨාලයේදී ය.

6-22

## ප්‍රකාශනයයි

උතුරු මැද පළාතේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ සිංහල පත්තුවේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින්, ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සළකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : කළු ගඟ සහ මාතලේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මායිම්; දකුණට : මාතලේ දිස්ත්‍රික්කයේ ගංගාලේ උඩසිය පත්තුව; නැගෙනහිරට : මාතලේ දිස්ත්‍රික් මායිම; බස්නාහිරට : පොළොන්නරු දිස්ත්‍රික්කයේ මැදපත්තු මායිම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොළොන්නරුව පශු වෛද්‍ය තැනගෙන් හෝ තමන්කඩුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඨාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 මැයි 22 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඨාලයේදී ය.
6-31

## ප්‍රකාශනයයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ ඇනළායතිවු දූපතේ ගවයන් අතර "බ්ලැක් ක්වාටර්" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : මුහුද; දකුණට : මුහුද; නැගෙනහිරට : මුහුද; බස්නාහිරට ; මුහුද.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර යාපනය පශු වෛද්‍ය තැනගෙන් හෝ (කයිට්ස්) දූපත කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඨාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 මැයි 22 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඨාලයේදී ය.
6-68

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**රථවාහනයන්ට අවහිරවීම**

**වයඹ කොට්ඨාශය** — **හලාවත දිස්ත්‍රික්කය**

### මාන්කුලම-කොක්කවිල පාරේ අංක 2/3 බෝක්කුව

1962 අප්‍රියෙල් 27 දින දරණ අංක 13,052 ගැසට් නිවේදනයට පසුවය. ඉහත පාර සියලු රථ වාහනයන් උදෙසා 1962 මැයි 11 දින සිට විවෘතව පවතින බැව් මෙයින් නිවේදනය කරමි.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 මැයි මස 22 වැනි දා,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේදීය.
6-42

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**වයඹ කොට්ඨාශය** — **හලාවත දිස්ත්‍රික්කය**

**මැල්ලවපිටිය-රඹොඩගල්ල-කැප්පෙටිගල පාරේ අංක 19/2 පාලම**

ඉහත සඳහන් පාරේ එම පාලම හරහා ටො. 2 1/2 කට වඩා බර ඇති රථ වාහනයන්ට නැවත දන්වන තුරු යාමට ඉඩ දෙනු නොලැබේ.

වාහන වේගය සැතපුම් 5 කට සීමා කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 මැයි 24 වැනිදා,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ දීය.
6-117

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති නැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක් පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).

13. දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක්කොටසක් ... ... .... | 22 | 50 ... | 35 | 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 | 50 ... | 18 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 | 0 ... | 28 | 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... | 0 | 25 ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... | 0 | 50 ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, 1 වැනි කොටසේ එක් ඡේදයක් ... | 0 | 10 ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 20 ... | 0 | 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි